කැස්බෑව නගර සභාව
කොළඹ දිස්ත්‍රික්කය

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මාර්තු 02 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 අගෝස්තු 21 දින ද විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 අගෝස්තු 25 දින ද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට කැස්බෑව නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| (i) | 2019 ජූලි සිට දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදයට අදාලව කසළ බැහැර කිරීම වෙනුවෙන් අපද්‍රව්‍ය කළමණාකරණ අධිකාරියට ගෙවිය යුතු මුදල රු.9,248,015 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල රු.10,747,592 ක් ලෙස දක්වා තිබුණි. | නිවැරදි ශේෂ මත පදනම්ව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුවේ. | 2020 ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කරමි. |
| (ii) | 2019 වර්ෂය සඳහා පෞද්ගලික ආයතනවලින් ලැබිය යුතු කසළ ආදායම රු.1,271,645 ක් වුවත් මූල්‍ය ප්‍රකාශන අනුව ලැබිය යුතු කසළ ආදායම රු.456,828 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි ශේෂ මත පදනම්ව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුවේ. | 2020 වර්ෂයේ දී ලැබිය යුතු කසල ගාස්තු ගිණුම නිවැරදි කර ඉදිරිපත් කරන බව දන්වමි. |
| (iii) | මාර්ගවල පළුදු වැසීම වෙනුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු මුදල් ගෙවා අවසන් වුවද ණයහිමි වශයෙන් රු.5,160,179 ක් ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ණයහිමියන් සහ පීනික්ස් ව්‍යාපෘති වියදම එම වටිනාකමෙන් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | ගෙවා අවසන් වුවද ණයහිමි උපලේඛනයට මෙම මුදල වැරදීමකින් ඇතුලත් වී ඇති බැවින් එකී සටහන ඉවත් කිරීමට කටයුතු කරන ලදි. |
| (iv) | දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් ප්‍රධාන කාර්යාලය ඉදිකිරීම සඳහා ලැබිය යුතු ණයක් වශයෙන් රු.160,000,000 ක් මූල්‍ය ප්‍රකාශනවල | ණය අයදුම්පත් ඉදිරිපත් කර වර්ෂය තුළ නොලැබුනොත් | ණය අයදුම්පත්‍රය 2020.07.14 දිනැතිව පළාත් පාලන කොමසාරිස් වෙත ඉදිරිපත් කර |

| | | |
|---|---|---|
| දක්වා තිබුණත් 2020 ජුනි දක්වා ණය ලැබී නොතිබුණි. | පමණක් උපචිත ලෙස දැක්විය යුතුවේ. | ඇත. |

(ආ) **අසම්භාව්‍ය බැරකම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| බාහිර පාර්ශවයන් විසින් සභාවට එරෙහිව පවරා ඇති නඩු 07 ක් හා සභාව විසින් බාහිර පාර්ශවයන්ට එරෙහිව පවරා ඇති නඩු 01 ක් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | අසම්භාව්‍ය බැරකම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුවේ. | 2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කොට ඇති මූල්‍ය ප්‍රකාශනවල සටහන් වශයෙන් සභාව විසින් සහ සභාවට එරෙහිව පවරා ඇති නඩු වාර්තාවක් යා කිරීමට කටයුතු කර ඇත. |

(ඇ) **නොසැසඳුනු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයන් 06 කට අදාල ශේෂයන් ඒවාට අදාළ උපලේඛනයන් සමඟ සැසඳීමේදී රු.218,887 ක් වැඩියෙන් දැක්වීම සහ රු.705,835 ක් අඩුවෙන් දැක්වීම නිරීක්ෂණය විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ සැකසීමේ දී නිරවුල් කරන බව දන්වමි. |

(ඈ) **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**ලැබිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| 2016 හා 2017 වර්ෂයන්ට අදාළව ලැබිය යුතු දේපළ ණය පොළී ශේෂය වූ රු.869,688 ක් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් (බ.ප.) ප්‍රතිපූර්ණය කර නොතිබුණි. | දේපළ ණය පොළී ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ප්‍රමාද දෝෂයකින් මෙකී මුදල ප්‍රතිපූර්ණය කිරීමට නොහැකි වූ බවත් එම මුදල ප්‍රතිපූර්ණය කරන බවත් 2018.06.18 දින ලිපියක් මඟින් දන්වා තිබුණි. ඒ අනුව නැවත 2017 වර්ෂය සඳහා වූ මුදල 2018.09.03 දින මු.රෙ 115 මගින් අනුමැතිය ඉල්ලා යවා ඇත. |

**ගෙවිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට රු.133,674,363 ක් වූ පළාත් සභා ණයහිමි ශේෂය තුළ 2014 සිට 2016 දක්වා වර්ෂවලට අදාළ රු.12,962,962 ක් පැවතුණි. | පළාත් සභා ණයහිමි ශේෂය නිරවුල් කිරිමට කටයුතු කළ යුතුවේ. | 2020 අවසන් ගිණුම් සකස් කිරීමේදී නිරවුල් කරන බව දන්වා සිටිමි. |

(ඉ) **විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| රු.641,883,464 ක් වූ ගිණුම් විෂයයන් 08 ක් සඳහා අවශ්‍ය තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | ශේෂ තහවුරු කර ගැනීම සඳහා උපලේඛන හෝ අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කළ යුතුවේ. | උපලේඛන සකස් කරමින් පවතින අතර ඉදිරියේදී එය විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

1.4 **අනුකූල නොවීම**

1.4.1 **නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | | | |
| 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛයේ 3:1 ඡේදය | සභාව සතු වාහන 26 ක ඉන්ධන දහන පරික්ෂාව සිදුකර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | වාහන 09 කට අදාළව ඉන්ධන පරීක්ෂාව සිදුකර අවසන්ව ඇති අතර එම වාර්තා විගණනයට ඉදිරිපත් කර ඇත. |

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.84,546,284 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.75,226,872 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**

2.2.1 **ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | **2019** | | | | **2018** | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **ආදායම් ප්‍රභවය** | **ඇස්තමේන්තු ගත ආදායම** | **බිල්කළ ආදායම** | **රැස්කළ ආදායම** | **දෙසැම්බර් 31 දිනට මුළු හිඟය** | **ඇස්තමේන්තු ගත ආදායම** | **බිල්කළ ආදායම** | **රැස්කළ ආදායම** | **දෙසැම්බර් 31 දිනට මුළු හිඟය** |
| | **(රු.) '000** | **(රු.) '000** | **(රු.) '000** | **(රු.) '000** | **(රු.) '000** | **(රු.) '000** | **(රු.) '000** | **(රු.) '000** |
| වරිපනම් හා බදු | 89,851 | 90,621 | 85,853 | 55,225 | 72,735 | 87,995 | 98,113 | 44,401 |
| කුලී | 23,422 | 18,050 | 20,854 | 2,950 | 17,462 | 18,802 | 20,672 | 3,373 |
| බලපත්‍ර ගාස්තු | 1,402 | 1,444 | 1,876 | 252,114 | 1,950 | 1,293 | 1,594 | - |
| වෙනත් ආදායම් | 240,689 | 200,000 | 315,865 | 409,018 | 200,907 | 160,501 | 295,875 | 466,797 |

2.2.2 **වරිපනම් හා බදු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| (අ) | නගර සභා ආඥාපනතේ 170 වන වගන්තිය ප්‍රකාරව වරිපනම් බදු අයකර ගැනීමට සභාව කටයුතු නොකිරීම නිසා 2019 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් ශේෂය රු.53,875,578 ක් වූ අතර එහි රු.50,000 ක් ඉක්මවූ වරිපනම් ඒකක 26 කින් අයවිය යුතු රු.2,263,705 ක් විය. | හිඟ වරිපනම් බදු ආදායම අයකර ගැනිමට කටයුතු කළ යුතුවේ. | රු.50,000 ට වැඩි දේපල 13 ක රු.1,551,072 ක හිඟය අයකර ගැනීමට නොහැකි ලෙස තහවුරු වී ඇති බැවින් සහා අනුමැතිය මත ලේඛණ නිවැරදි කිරීමට කටයුතු කර ඇත. දේපල 10 ක් සඳහා පැවති හිඟය ලෙස රු.1,703,396,801 ක් සම්පූර්ණ වශයෙන් හා කොටස් වශයෙන් අයකර ගැනීමට කටයුතු කර ඇත. මේ වන විට හිඟ ශේෂය රු.2,263,705 ක් වන අතර දේපල සංඛ්‍යාව 26 කි. |
| (ආ) | සමාලෝචිත වර්ෂය සඳහා බිල්කිරීම් රු.79,751,940 ක් වුවද ඉන් වර්ෂය තුලදී රු.55,576,786 ක් පමණක් අයකර ගෙන තිබුණි. | බිල්කළ වරිපනම් බදු ආදායම අයකර ගැනිමට කටයුතු කළ යුතුවේ. | හිඟයෙන් රු.9,947,833 ක් අයවී ඇති අතර ඉතිරි හිඟ මුදල රටේ පවතින වාතාවරණය යහපත් වූ විට අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2019 ජනවාරි 01 දිනට හිඟය වු රු.44,401,255 කින් වර්ෂය තුලදී රු.18,773,673 ක් පමණක් අයකරගෙන තිබුණි. | හිඟ වරිපනම් බදු ආදායම අයකර ගැනිමට කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |
| (ඈ) | මූලා‍ය ප්‍රකාශන අනුව ලැබිය යුතු කසළ ආදායම් රු.871,279 ක් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | ලැබිය යුතු කසළ ගාස්තු අයකර ගැනිමට පියවර ගත යුතුවේ. | සෑම මාසයකම මුල් දින 10 තුළ මුදල් නොගෙවන ආයතන සඳහා සේවය අත්හිටුවීමට තීරණය කර ඇත. කසල බදු ගෙවීම් නොකරන ආයතන ප්‍රසිද්ධ කර එම ආයතන වලින් හිඟ මුදල් ලබා ගැනීමට අදාළව නව වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර ඇත. |
| (ඉ) | 2009 සිට 2014 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාළ විථි ආලෝක ආධාර රු.481,578 ක් හා 2014, 2015 වර්ෂයන්ට අදාළව පිළියන්දල ක්‍රීඩා සමාජයෙන් ලැබිය යුතු විදුලි පරිභෝජන ගාස්තු රු.18,509 ක් අයකරගෙන නොතිබුණි. | වීථි ආලෝක ආධාර ශේෂය හා ලැබිය යුතු විදුලි ගාස්තු ශේෂය අය කර ගැනිමට කටයුතු කළ යුතුවේ. | වීථි ආලෝක ආධාර ශේෂය රු.254,748 ක් කපා හැරීම සඳහා අනුමැතියට ඉදිරිපත් කර ඇත. ද්වී ගණනය වී ඇති රු.226,830 වැරදි බිල් කිරීම ගිණුම් මගින් නිවැරදි කර ඇත.<br>විදුලි ගාස්තු ගෙවීමට ක්‍රීඩා සමාජය එකඟ වී ඇත. |
| (ඊ) | 2019 දෙසැම්බර් 31 දිනට පොදු පහසුකම් මධ්‍යස්ථානයෙන් අයවිය යුතු රු.68,790 ක් සහ 1997 සහ 1998 වර්ෂ සඳහා අයවිය යුතු විනෝද බදු රු.281,047 ක් අය කර ගැනීමට අපොහොසත් වී තිබුණි. | විනෝද බදු හා අනෙකුත් ආදායම් අයකර ගැනිමට කටයුතු කළ යුතුවේ. | රු.44,865 ක් අයකර ගැනීම සඳහා කැස්බෑව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා ඇත. වග උත්තරකරු සොයාගැනීමට නොහැකි වූ නිසා නඩුව බහා තබා ඇත.<br>රු.23,925 ක් අයකර ගත නොහැකි මුදලක් ලෙස සලකා කපා හැරීමට මහා සභාවේ අනුමැතිය මත ඉදිරි අනුමැතීන් සඳහාත්, විනෝද බදු රු.281,047 ක් කපා හැරීමට මහා සභා අනුමැතිය මත විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතියටත් යොමු කර ඇත. |
| (උ) | වාහන නවතා තැබීමේ බදු කුලී වශයෙන් අයවිය යුතු රු.291,622 ක් අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි. | බදු මුදල් එකවර අයකර ගැනිමට කටයුතු කළ යුතුවේ. | නඩුව විභාග වෙමින් පවතී. ගෙවන ලද රු.17,000 ක හිඟ මුදල 2018 ට පෙර හිඟයෙන් අයවී ඇත. |

2.2.3 <u>කුලී</u>

**(අ)** <u>දිගු කාලීනව බදු දෙන දේපල</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| | --------------------------- | --------------- | ------------------------- |
| (ii) | 2019 ජනවාරි 01 දිනට හිඟ කඩ කුලී ශේෂය රු.2,493,440 ක් වූ අතර ඉන් සමාලෝචිත වර්ෂය | හිඟ මුදල් අයකර ගැනිමට කටයුතු කළ | රු.1,039,665 ක පැරණි මාළු කඩ හිඟ මුදල දැනට කපා හැරීම සඳහා |

| | | | |
|---|---|---|---|
| | තුළදී රු.1,155,450 ක් පමණක් අයකර ගෙන තිබුණි. | යුතු අතර ලැබිය යුතු ආදායම් වර්ෂය තුළම ලබා ගැනිමට කටයුතු කළ යුතුවේ. | අනුමැතිය ලැබී තිබේ. ඒ අනුව හිඟ මුදල රු.298,325 කි. 2020.06.30 දින වනවිට මින් රු.60,500 ක් ගෙවා ඇති අතර තවදුරටත් හිඟ ශේෂය රු.237,825 කි. |
| (iii) | සභාව සතු දිගු කාලීනව බදු දෙන දේපල 135 කින් 2019 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ ශේෂය රු.2,354,045 ක් වුවද එම ශේෂය තුළ වාරික 10 ට වැඩි දේපල 07 ක හිඟ ශේෂය රු.294,650 ක් විය. | හිඟ මුදල් අයකර ගැනිමට හා වර්ෂයේ ආදායම් අදාළ කාලය තුළ ලබා ගැනිමට කටයුතු කළ යුතුවේ. | අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

**(ආ)** <u>වාර්ෂිකව ටෙන්ඩර් මත බදු දෙන දේපල</u>

| | විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| | --------------------------- | --------------- | ------------------------- |
| (i) | 2019 ජනවාරි 01 දිනට බදු දේපල හිඟ ශේෂය රු.308,622 ක් වුවද ඉන් වර්ෂය තුළ රු.17,000 ක් පමණක් අයකර ගෙන තිබුණි. | වාර්ෂිකව ටෙන්ඩර් මත බදු දෙන දේපල ආදායම අයකර ගත යුතුවේ. | නඩු පවරා ඇත. වඟ උත්තරකරු මිය ගොස් ඇති බැවින් කපා හැරීම සඳහා අමාත්‍යවරයාගේ අනුමැතියට යොමුකර ඇත. |
| (ii) | ටෙන්ඩර් මත බදු දුන් රථ වාහන ගාල් කිරීමේ හිඟ ශේෂය රු.522,073 ක් සහ පොදු වැසිකිලි හා උදෑසන පොළෙහි හිඟ ශේෂය රු.64,366 ක් වුවද ඉන් වර්ෂය තුළදී කිසිදු මුදලක් අයකර ගෙන නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනිමට කටයුතු කළ යුතුවේ. | වාර්ෂික ටෙන්ඩර් මත බදු දුන් රථ ගාලට අදාලව හිඟය රු.521,079 ක් වන අතර පොදු වැසිකිලි හා උදෑසන පොල හිඟය රු.78,630 කින් හිඟ රු.9,840 ක් අයවී ඇති අතර පොදු පහසුකම් මධ්‍යස්ථානයෙන් මුදල් අය වී නොමැත. ඒ සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර ඇත. |

2.2.4 <u>බලපත්‍ර ගාස්තු</u>

| | විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| | --------------------------- | --------------- | ------------------------- |
| (අ ) | 2019 දෙසැම්බර් 31 දිනට සභා බල ප්‍රදේශය තුළ වරිපනම් ගෙවන ව්‍යාපාර ස්ථාන සංඛ්‍යාව 7986 ක් වුවද 2019 වර්ෂය සඳහා ව්‍යාපාර ස්ථාන 4061 කින් වෙළඳ බලපත්‍ර ගාස්තු හෝ ව්‍යාපාර බදු අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි. | වෙළඳ බලපත්‍ර හෝ ව්‍යාපාර බදු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. සමීක්ෂණයෙන් ප්‍රදේශයේ ඇති සත්‍ය වෙළඳ ව්‍යාපාර සංඛ්‍යාව තහවුරු කළ යුතුවේ. | 2011 තක්සේරු ප්‍රතිශෝධනයේදී ව්‍යාපාරික ස්ථාන (වාණිජ) දේපල ලෙසට 7986 ලේඛණ ගතවී ඇත.තක්සේරුකරණය සඳහා වසර 03ක පමණ කාලයක් ගත කොට තක්සේරු දෙපාර්තමේන්තුවේ නිළධාරින් සහ නගර සභාවේ නිළධාරින් එකතුව මුළු බල ප්‍රදේශය පුරාවට නේවාසික දේපල තක්සේරු කර ඇති නමුත්, බලපත්‍ර සහ ව්‍යාපාර බදු අයකිරීමේදී සීමිත කාලයක් තුල බල ප්‍රදේශයේ කටයුතු කල ද සමහර අතුරු මාර්ග වල නේවාසිකව පවත්වාගෙන ගිය ව්‍යාපාර මගහැරී ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු වෙළඳ බලපත්‍ර වටිනාකම රු.252,114 ක් වුවද ඉන් රු.244,114 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගෙන නොතිබුණි. | හිඟ වෙළඳ බලපත්‍ර අයකර ගැනිමට කටයුතු කළ යුතුවේ. | රු.44,210 ක බලපත්‍ර ගාස්තු මුදල 2020.06.11 දින මහ සභාවේ 5:6 යෝජනාව පරිදි සම්මත වී කපා හැරීමට නියමිතය.<br>2016,2017,2018,2019 වර්ෂවලට අදාළව රු.15,000 ක ශේෂය සඳහා අධිකරණයෙහි නඩු පවරා ඇති අතර අයකර ගැනීමට කටයුතු කරමින් පවතී.<br>2015,2014,2013, හා 2013ට පෙර ශේෂය රු.187,615 ක් අයකර ගත නොහැකි ශේෂයක් ලෙස සලකා කපා හැරීමට නියමිතව ඇත. |

2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| ආදායම් ණයගැති ශේෂයෙහි ඇතුළත් රු.295,018,225 ක හිඟ මුද්දර ගාස්තු ආදායම තුළ 2017 හා 2018 වර්ෂයන්ට අදාළ රු.95,018,225 ක හිඟ ශේෂයක් පැවැතුණි. | හිඟ මුද්දර ගාස්තු අයකර ගැනිමට කටයුතු කළ යුතුවේ. | රු.114,000,000 ක් ලැබී ඇති අතර, තව දුරටත් අයවිය යුතු මුදල රු.95,018,225 ඉදිරි දිනයන්හිදී ලැබීමට නියමිතය. |

3. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

3.1. <u>කාර්ය සාධනය</u>

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) <u>ක්‍රියාකාරී සැලැස්ම</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය ආරම්භ වීමට පෙර ක්‍රියාකාරී සැලැස්ම සකස් කර විධිමත් පරිදි අනුමත කර ගෙන නොතිබූ අතර එක් එක් ක්‍රියාකාරකම් සඳහා ගතවන කාලසීමාව හා කාර්යසාධනය පැහැදිළිව හඳුනා ගැනීමට ප්‍රමාණවත් තොරතුරු දක්වා නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්ම පැහැදිළිව ක්‍රියාකාරකම් හා ගතවන කාලය ඇතුළුව සකස් කර අදාළ වර්ෂයට පෙර ඉදිරිපත් කළ යුතුවේ. | 2020 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේදී ඉහත අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කර ඇත. |

(ආ) **කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| --------------------------- | --------------- | ------------------------- |
| සමාලෝචිත වර්ෂයට සහා අරමුදලින් ක්‍රියාත්මක කිරීමට ගිවිසුම්ගත වූ වටිනාකම රු.3,193,521 ක ව්‍යාපෘති 06 ක් 2020 ජුනි 19 දින වන විටත් අවසන් කර නොතිබුණි. | ව්‍යාපෘති අදාළ ගිවිසුම් ගත කාලපරිච්ඡේදය තුළ ඉටු කළ යුතුවේ. | ව්‍යාපෘති 03ක් මේ වනවිට අවසන් කර ඇති අතර ඉතිරි ව්‍යාපෘති වල වැඩ කෙරීගෙන යන අතර ප්‍රමාදවීම් සඳහා ගාස්තු අය කෙරේ. |

(ඇ) **කොන්ත්‍රාත් පරිපාලනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| --------------------------- | --------------- | ------------------------- |
| ගම්පෙරලිය සහ සුබිත පුරවර වැඩසටහන යටතේ ව්‍යාපෘති 45 ක වැඩ අවසන් කර තිබුණද රු.34,275,007 ක මුදලක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලැබිය යුතුව තිබුණි. | අදාළ මුදල් නොපමාව ලබාගෙන ගෙවීම් කඩිනම් කළ යුතුවේ. | ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ගම්පෙරලිය ව්‍යාපෘති 26 ක් හා සුබිත පුරවර ව්‍යාපෘති 19 සඳහා මුදල් ලැබී නොමැති අතර එම මුදල් ලද පසු ගෙවීම් කිරීමට නියමිතය. |

(ඇ) **කසළ කළමණාකරණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| | --------------------------- | --------------- | ------------------------- |
| (i) | 2019 වර්ෂයට අදාල වෙන්කල කසළ වෙනුවෙන් රු.2,121,800 ක් හා වෙන් නොකරන ලද කසළ වෙනුවෙන් රු.14,236,000 ක් සභාව දරා තිබුණි. කසළ කළමනාකරණය දුර්වල තත්වයක පැවතුණු අතර කසළ වෙන් නොකිරීම හේතුවෙන් රු.11,388,800 ක් වැඩිපුර ගෙවීමට සිදු වී තිබුණි. | කසළ කළමනාකරණ ව්‍යාපෘතිය අදාළ කාලසිමාව තුළ ක්‍රියාත්මක කළ යුතුවේ. | නගර සභාව මඟින් පවත්වන ලද විශේෂ ශ්‍රමදාන වැඩසටහන්, විශේෂ ඩෙංගු මර්ධන වැඩසටහන් වලදී හා සෞ.වෛ.නි. කාර්යාලය මඟින් පවත්වන ලද ලට්ට ලොට්ට වැඩසටහන් ආදිය මඟින් කසළ එකතු කිරිම නිසා මිශ්‍ර කසළ ප්‍රමාණය වැඩි විමට හේතු වී ඇත. තවද ප්‍රජාව කොපමණ දැනුවත් කළත් මාර්ගය දෙපස කසළ දමා යාම නිසා ඒවා දෛනිකව ඉවත් කිරීමට සිදුවේ. එබැවින් මිශ්‍ර කසළ සඳහා වැඩි අගයක් ගෙවීමට සිදුව ඇත. |
| (iii) | පළාත් පාලන ආයතන ගණනාවකින් කසළ බැහැර කරනු ලබන කරදියාන කසල අංගනය පිහිටි භූමියෙන් සියයට 80 ක් කැස්බෑව නගර සභා බල ප්‍රදේශයට අයත් වන අතර කසල අංගනයේ සිට මීටර් තුන් දහසක් ඉක්මවූ දුරකට ඉතා දැඩි දුර්ගන්ධයක් හමා යාම, මැසි මදුරු උවදුර නිසා බල ප්‍රදේශයේ ජනතාව මහත් පීඩාවකට පත්වීම, එම තත්වයන් | වගකිව යුතු පාර්ශව දැනුවත් කර පිළියම් යෙදිය යුතුවේ. | කරදියාන කසල අංගනය පිහිටි භූමිය කැස්බෑව නගර සභා බල ප්‍රදේශයට අයත් වුවද, මෙහි පාලන අධිකාරිය වන්නේ බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියයි. පවතින අවදානම් තත්ත්වය පිළිබඳව අතිගරු ජනාධිපතිතුමා. ගරු අග්‍රාමාත්‍යතුමා ඇතුළු |

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| | ජනතාවගේ ජන ජීවිතයට විශාල තර්ජනයක් ඇති වීම, කසළ අංගනයෙන් ගලායන ජලය හේතුවෙන් ප්‍රදේශයේ ස්වභාවික ජල සම්පත විනාශ වීම ආදිය හේතුවෙන් ප්‍රදේශයේ ජනතාවට අයහපත් සෞඛ්‍ය ගැටළු හා අවදානම් තත්වයක් ඇතිව තිබුණි. | | වගකිවයුතු පාර්ශවයන් වෙත ලිපි යොමු කර ඇත. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| (අ) | සභාවට අයත් බෝකුන්දර රජයේ නිවාස වල කුලී පදනම මත දීර්ඝ කාලයක සිට පදිංචිව සිටින කුලී නිවැසියන් 17 දෙනෙකුට ඉඩම් ඔප්පු ලබාදීම සම්බන්ධ යෝජනාව 2010 පෙබරවාරි 23 දින මහා සභාවේ ඒකමතිකව සහා සම්මත වී තිබුණද ඉඩම් බෙදා දීම සම්බන්ධයෙන් පවතින ගැටළු නිරාකරණය කර ඔප්පු ලබා දී නොතිබුණි. | ගැටළු නිරාකරණය කර ඔප්පු ලබා දීමට කටයුතු කළ යුතුවේ. | නිවාස කුලී ගෙවීමෙන් සම්පූර්ණව බැහැර වී ඇති බැවින් පළාත් පාලන කුලී නිවාස ප්‍රඥප්තිය යටතේ කටයුතු කිරීමට නොහැකි වී ඇත. එබැවින් නගර සහා ආඥාපනතේ 36 (ඉ) වගන්තිය අනුව නගර සභා දේපල බැහැර කිරීම් යටතේ කටයුතු කිරීම සඳහා සැලසුම් අංක 5337 හි බිම් කැබලි 17 ක් තක්සේරු දෙපාර්තමේන්තුව ලවා තක්සේරු කරවාගෙන එම පදිංචිකරුවන් වෙත මෙම දේපල බැහැර කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. |
| (ආ) | 2007 වර්ෂයේ සිට පැවත එන ඉදිකිරිමේ ආයතනයකින් අයවිය යුතු රු.164,203 ක අත්තිකාරම් මුදල පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අත්තිකාරම් මුදල පියවා ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී වගකිව යුත්තන් නිශ්වය කර අය කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ඇ) | 2008 සිට 2010 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුල සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් රු.1,870,831 ක් නොගෙවීම නිසා රු.935,413 ක අධිභාරයද ඇතුළුව 2017 ජුලි සිට 2019 දෙසැම්බර් 31 දක්වා සභාව විසින් ගෙවන ලද රු.2,806,243 ක මුදල ඊට වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගෙන නොතිබුණි. | මු.රෙ. 156 ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2008 සිට 2012 දක්වා කාලසීමාව තුළ රාජකාරි ඉටුකළ නිලධාරීන්ගෙන් මේ සම්බන්ධයෙන් නිරීක්ෂණ ඉදිරිපත් කරන ලෙස දැනුම් දී ඇති බව දන්වා සිටිමි. |

3.3. මානව සම්පත් කළමනාකරණය

(අ) සේවක පුරප්පාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| (i) | මාණ්ඩලික මට්ටමේ තනතුරු 02 ක් ඇතුළුව සේවක පුරප්පාඩු 17 ක් පැවතුණි. | අත්‍යාවශ්‍ය පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | බඳවා ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ii) | සභාවේ ව්‍යාපෘති වෙනුවෙන් බඳවා ගෙන තිබූ සේවකයන් 71 දෙනෙකුට සමාලෝචිත වර්ෂය සඳහා වැටුප් හා දීමනා ලෙස රු.15,246,946 ක් සභා අරමුදලින් ගෙවා තිබුණි. | අනුමත තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කළ යුතුවේ. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් කාර්ය මණ්ඩල සමාලෝචනයක් කර තනතුරු අනුමත කර ඇත්තේ 2013 වර්ෂයේදීය. එතැන් සිට ඉදිරියට නගර සභාවේ අවශ්‍යතා වෙනුවෙන් ව්‍යාපෘති කිහිපයක් පළාත් පාලන කොමසාරිස් මගින් අනුමත කරවා ගෙන ඇති අතර එම සේවක අවශ්‍යතාවය මූ.රෙ.71 යටතේ තනතුරු ඇති කිරීමට පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් කර ඉදිරිපත් කර තිබේ. |

(ආ) <u>සේවක ණය</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| | --------------------------- | --------------- | ------------------------ |
| (i) | අයවිය යුතු සේවක ණය ශේෂය තුළ නිලධාරීන් 11 දෙනෙකුගෙන් වර්ෂ 2011 සිට 2016 දක්වා අයවිය යුතු රු.307,226 ක ණය ශේෂයෙන් සමාලෝචිත වර්ෂය තුල කිසිදු මුදලක් අයකර ගෙන නොතිබුණි. | ණයකරුවන් ණය පැහැර අරින අවස්ථාවන්හි ඇපකරුවන්ගෙන් අය කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | නිලධාරීන් දෙදෙනෙකු ගෙවීමට එකඟ වී ඇත.<br>නිලධාරීන් දෙදෙනෙකු රු.6,250 ක් හා රු.6963ක් ගෙවා ඇත. |
| (ii) | 2018 අගෝස්තු 23 දින සේවයෙන් පහ කරන ලද නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.233,523 ක ආපදා ණය ශේෂය හා 2018 වර්ෂයේ සේවය හැර ගිය සේවකයෙකුගෙන් අයවිය යුතු රු.82,178 ක ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ. |
| (iii) | මියගිය, සේවය හැරගිය හා විශ්‍රාම ගිය නිළධාරීන් 04 දෙනෙකුගේ රු.206,895 ක ණය ශේෂය අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | උරුමක්කාරයින්ගෙන් කොටසක් හෝ අය කර ගැනීමට කටයුතු කරමින් සිටින අතර මෙම ණය මුදල් අය කර ගැනීමට ඇති අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස් වෙත ද වාර්තා කොට ණය ශේෂ ඉවත් කිරීමට අනුමැතිය ලබා ගැනීමට ඉල්ලීමක් කොට ඇත. |

3.4 **<u>වත්කම් කළමනාකරණය</u>**

3.4.1 **<u>පවරා නොගත් වත්කම්</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| -------------------------- | --------------- | ---------------------------------------------- |
| සභා බල ප්‍රදේශයේ පවතින සුසාන භූමි 14 න් 13 ක හිමිකම (අයිතිය) පවරා ගැනීමේ කටයුතු ඉතාම මන්දගාමී තත්වයක පැවතුණි. | සුසාන භූමිවල අයිතිය පවරා ගත යුතුවේ. | සුසාන භූමිවල කැස්බෑව නගර සභාව වෙත පවරා ගැනීම සඳහා කටයුතු කරමින් පවතින අතර මේ වන විට සුසානභූමි 5ක (දිගන,කහපොළ,විශ්වකලාව,කැස්බෑව හා |

| | | |
|---|---|---|
| | | හැඩිගම) මැනුම් නියෝග ලැබී මැනුම් කටයුතු ආරම්භ කර ඇත. ඒ අනුව ඉදිරියේදී සුසාන භූමිවල හිමිකම් ඔප්පු ලබා දීමට කටයුතු කරන බව දන්වා ඇත. |

3.4.2 **නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභා බල ප්‍රදේශයේ තිබෙන පර්චස් 1676.75 ක් විශාල ඉඩම් කැබලි 34 ක වර්තමාන ලිපිනය හෝ වර්තමාන භාවිතය පිළිබඳ තහවුරු නොවුනු අතර පර්චස් 1898.83 ක් විශාල ඉඩම් කැබලි 22 ක් ඵලදායී කටයුත්තකට යොදා නොගෙන හිස් ඉඩම් වශයෙන් පැවතුණි. | අනාගත සංවර්ධනය සඳහා සභාවේ ඉඩම් ආරක්ෂා කළ යුතුවේ. | අංක 392/9 හා 1986.03.10 දිනැති නාගරික සංවර්ධන අධිකාරිය යටතේ අතිවිශේෂ ගැසට් නිවේදනයේ සඳහන් නියෝගයේ 22 (1) (2) හා 23 වගන්තිවලින් දැක්වෙන පරිදි කටයුතු කර ඇත. |
| (ආ) | ඉඩම් 74 කින් ඉඩම් 56 ක් ඵලදායී කටයුත්තකට යොදා ගෙන නොතිබූ අතර ඉඩම් අනවසර අල්ලා ගැනීම්වලට ලක් වී තිබුණි. | අනවසරයෙන් අල්ලා ගැනිම වැළැක්වීම සඳහා සභා සතු ඉඩම් භෞතිකව හඳුනා ගත යුතු අතර අනාගත සංවර්ධනය සඳහා සභාවේ ඉඩම් ආරක්ෂා කළ යුතුවේ. | මෙම හිස් ඉඩම් සම්බන්ධව මැනුම් කටයුතු කිරීමට විශාල මුදලක් වැයවන බැවින් පත්කරන ලද කමිටුව මගින් අදාල ඉඩම් පිළිබඳ ස්ථානීය පරීක්ෂාවක් සිදු කොට ඉදිරියේදී ප්‍රජා මණ්ඩල සහභාගීත්වයෙන් නිශ්චිත ක්‍රියා පිළිවෙලක් සකස් කිරීමට නියමිතය. |

3.4.3 **වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| 2019 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව ගබඩාවේ GI පයිප්ප 236 ක්, සභා ශාලාවේ පුටු 02 ක් හා අල්මාරියක ඌණතාවයක් තිබුණි. | මුදලින් හෝ භාණ්ඩ වලින් අයකර ගැනිමට කටයුතු කළ යුතුවේ. | GI පයිප්ප 236 සම්බන්ධව පරීක්ෂා කිරීමට පත් කරන ලද පරීක්ෂණ මණ්ඩලය විසින් වාර්තාව ලබා දී ඇති අතර එය 2020/07/09 දින මහ සභාවේදී තවදුරටත් පරීක්ෂා කර අනුමැතිය ලබා දීමට තීරණය කර ඇත. පුටු 02 හා අල්මාරිය සම්බන්ධ ඌනතාවය සම්පූර්ණ කිරීමට කටයුතු කරනු ලැබේ. |